# COVID-19 එන්නත් වැඩසටහන පිළිබඳව

2021 අප්‍රේල් 28 වන විට

**වැඩසටහන් දළ විශ්ලේෂණය**

මහජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීමට සහ දෛනික සමාජ කාර්යයන් යළි ආරම්භ කිරීමට ඉඩ සැලසීම සඳහා ආණ්ඩුව මගින් සියලු හොංකොං ජනතාව වෙනුවෙන් පුළුල් ප්‍රදේශ ආවරණය වෙන පරිදි නොමිලයේ එන්නත් සැපයේ.

විමසීම් සඳහා සෘජු දුරකථන අංකය: 3142 2366

*පෞද්ගලික සායනවල පැවැත්වෙන එන්නත් වැඩසටහන් සඳහා මාර්ගගත වෙන් කිරීම් හෝ හමුවීම් නියම කර ගැනීම සඳහා සහාය අවශ්‍ය වන වැඩිහිටි පුද්ගලයින්ට ළඟම ඇති දිස්ත්‍රික් සමාජ කේන්ද්‍ර, අසල්වැසි වැඩිහිටි කේන්ද්‍ර සහ වැඩිහිටියන් සඳහා වූ සමාජ කේන්ද්‍රය වෙත ප්‍රවේශ වීමට හෝ  අදාළ ඒකාබද්ධ නිවෙස් රැකබලා ගන්නා සේවා කණ්ඩායම්/ වැඩිදියුණු කළ නිවාස හා සමාජ සත්කාර සේවා කණ්ඩායම්/ දිවා සුරැකුම් මධ්‍යස්ථාන/ වැඩිහිටි ඒකක හා සම්බන්ධ වීමට හෝ සමාජ සුබසාධන දෙපාර්තමේන්තුවේ සෘජු කරකථන අංකය වන 2343 2255 ඇමතිය හැකිය.

**ස්ථාන**

මතු දැක්වෙන ස්ථානවලදී මහජනතාවට එන්නත් සේවාව සැපයීමට ආණ්ඩුව සැලසුම් කරයි.
එන්නත් දෙනු ලබන ස්ථාන සඳහා :
https://www.map.gov.hk/gm/map/s/m/communityvaccinationservicesofcovid-19?lg=en

## 1. ප්‍රජා එන්නත් මධ්‍යස්ථාන(CVC) (*වෙන්කිරීම් අවශ්‍ය වේ)

මහජනතාවට එන්නත් සේවා සැපයීම සඳහා ආණ්ඩුව මගින් දිස්ත්‍රික්ක 18 තුළම CVCs පිහිටුවනු ලැබේ. CVC තුළ සපයනු ලබන්නේ එන්නත් වර්ග එකක් පමණකි.
සුදුසුකම් ඇති පොදු ජනතා සාමාජිකයින්ට තමුන් ලබාගන්නා එන්නත තෝරා ගත හැකි අතර එමගින් තමුන්ගේ ප්‍රථම මාත්‍රාව සහ දෙවන මාත්‍රාව ලබා ගන්නා වේලාව සහ ස්ථානය පැය 24 පුරා ක්‍රියාත්මක වන මාර්ගගත වෙන්කිරීම්  පද්ධතිය තුළින් වෙන්කර ගත හැකිය.
වයස 70 හෝ ඊට වැඩි වැඩිහිටියන් සමග පැමිණෙන උපරිම වශයෙන් පුද්ගලයන් දෙදෙනෙකුට ද එන්නත ලබා ගැනීමට අවස්ථාව ඇති අතර එකම වේලාවේදී එය වෙන්කරවා ගත හැකිය.
අවශ්‍ය වුවහොත්, මාර්ගගත වෙන්කරවා ගැනීම් සඳහා තැපැල් කාර්යාල, හෝ ඔවුන් වාසය කරන පොදු නිවාස වතුවල පිහිටි වතු කළමනාකාර කාර්යාල වෙතින් මහජනතාවට සහාය ලබාගත හැකිය.
සටහන: CVCs ක්‍රියාත්මක වීම අරඹනු ලබන්නේ අදියර යටතේය වන අතර එය හොංකොං වෙතට එන්නත් ලඟා වීම, එන්නත් ප්‍රමාණය සහ එන්නත්වල තත්වය මත රඳා පවතී.
විවෘත කර තබන වේලාවන්:

- පෙ.ව. 8 සිට ප.ව. 8  (සඳුදා සිට ඉරිදා දක්වා)

රැගෙන ආ යුතු ලේඛන:

- අනන්‍යතා ලේඛනයt

- ○ දෙමව්පියන්/භාරකරුවන් විසින් අත්සන් කරන ලද කැමැත්ත ප්‍රකාශ කිරීමේ පෝරමය (අදාළ වන්නේ වයස 16 – 17 අතර පුද්ගලයින්ට / මානසික අයෝග්‍යතා ඇති එන්නත් ලාභීන්ට) [සාම්පල කැමැත්ත පළ කිරීමේ පෝරමය භාගත කිරීම සඳහා]
- ○ වෙන්කර ගැනීම ස්ථිර කෙරෙන කෙටි පණිවිඩයක් හෝ ඡායා පිටපතක්

**2. රෝහල් අධිකාරිය විසින් නම්කරන ලද බාහිර රෝගී සායන (GOPCs)** (*වෙන්කර ගැනීම අවශ්‍යය)

**3. නම්කරන ලද පෞද්ගලික සායන**

CVCs සහ පොදු සායන සඳහා මාර්ගගත වෙන්කර ගැනීම් වලින් තොරව පෞද්ගලික වෛද්‍යවරයකු හෝ සායනයක් වෙතින් එන්නත් සඳහා වේලාවක් නියම කර ගැනීමේ අවස්ථාව තෝරා ගැනීම ට පොදු ජනතාවට අවස්ථාව ඇත.

**4. නේවාසික සත්කාර නිවාස සහ සාත්තු නිවාස**

එන්නත් සේවාව ජනතාව වෙතට ගෙන ඒම හෝ සපයා ඇති වෛද්‍ය නිලධාරීන් හමුවීමෙන් එන්නත් ලබා ගැනීම.

**5. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (DH) මගින් නම් කරන ලද සායන**

DH මගින් සේවාදායකයින්ට/සාමාජිකයින්ට/ප්‍රමුඛතා ලැයිස්තුවේ සිටින රෝගීන්ට සහ DH's මගින් නම්කරනු ලබන සායනවල ලබාගැනීමේ සේවවාල එන්නත් සපයනු ඇත. DH සේවාදායකියින්ට අදාළ සායනය සමග හමුවීමක් යොදාගෙන එන්නත ලබාගත හැකිය.DH සායන වෙතින් එන්නත් වෙන්කරවා ගැනීම පොදු ජනතාව සඳහා විවෘත නොවේ.

<u>එන්නත ලබාගැනීම සඳහා සුදුසුකම් ලබන පුද්ගලයින්</u>

**වයස 16 න් ඉහළ හොංකොං පදිංචිකරුවන් නොමිලයේ එන්නත් ලබාගැනීම සඳහා සුදුසුකම් ලබයි. Comirnaty ලබා ගැනීම සඳහා අවම වයස් සීමාව 16 වන අතර CoronaVac සඳහා 18 වේ.**

සුදුසුකම් ලබන පුද්ගලයින්, නම් කරන ලද වෙබ් අඩවියක මාර්ගයෙන් මාර්ගගත වෙන්කිරීම් සිදු කරන විට හෝ පෞද්ගලික සායන වල එන්නත් වැඩසටහනක් සඳහා හමුවීම් නියම කරන විට සංඛ්‍යාන අරමුණු සඳහා පහත දැක්වෙන කණ්ඩායම් වලින් එකක් තෝරා ගන්න.

1. සෞඛ්‍ය සේවා පිහිටුවීම කාර්ය මණ්ඩල සහ වසංගත-මර්ධනය හා සම්බන්ධ වැඩකටයුතු වල නියැලෙන අය;
2. වැඩිහිටියන් සඳහා වූ නේවාසික සාත්තු නිවාසවල පදිංචිකරුවන් සහ සේවක මණ්ඩල/ ආබාධිත පුද්ගලයින් සහ වැඩිහිටියන් සඳහා වූ ප්‍රජා සත්කාර සේවාවල කාර්යමණ්ඩල/ ආබාධිත පුද්ගලියන්;
3. අවදානම් සහිත පොදු සේවාවල නියුක්ත කාර්ය මණ්ඩල(රාජ්‍ය සේවා කොන්ත්‍රාත්කරුවන් ඇතුළත්); සහ

4. සීමා ආශ්‍රිත මගී හා බඩු එහා මෙහා ප්‍රවාහන කාර්ය මණ්ඩල හෝ පාලන ඒකක වල හෝ වරායවල සේවය කරන කාර්ය මණ්ඩල.
5. ආහාරපාන පරිශ්‍රවල, වෙළඳපොළවල, සුපිරි වෙළඳසල් වල, සිල්ලර කඩවල සහ කුරියර් සේවාවල(ආහාර රැගෙන යාමේ සහ බෙදාහැරීම ඇතුළත්) කාර්ය මණ්ඩල
6. පොදු දේශීය ප්‍රවාහන සේවා ක්‍රියාකාරී සේවක මණ්ඩල(උදා. කුලී රථ/බස්/පොදු සැහැල්ලු බස් රියදුරන්, දුම්රිය කපිතන්වරුන්, සහ දුම්රියපොළ කාර්ය මණ්ඩල)
7. ලියාපදිංචි ඉදිකිරීම් සේවකයින් සහ ඉඩමේ වෙනත් නේවාසික කාර්ය මණ්ඩල
8. දේපළ කළමනාකරන කාර්ය මණ්ඩල(උදා. ආරක්ෂක නිලධාරීන්, පිරිසිදු කරන සේවක මණ්ඩල සහ දේපළ කළමනාකාර කාර්යාලය)
9. ගුරුවරුන් සහ පාසැලේ කාර්ය මණ්ඩල (උදා. පහළ බාලාංශ, ප්‍රාථමික සහ ද්විතීයික පාසල් සහ විශ්ව විද්‍යාල; විශේෂ පාසැල් වල කාර්ය මණ්ඩල; සහ පාසැල් බස්රථ වල සහ පාසැල් සැහැල්ලු බස් රථවල රියදුරන් සහ ආරක්ෂකයින්)
10. සංචාරක කර්මාන්තයේ සේවක මණ්ඩල
11. රෝග වැළැක්වීමේ සහ පාලනය යටතට ගැනෙන ලැයිස්තුගත පරිශ්‍රවල කාර්ය මණ්ඩල (අවශ්‍යතා සහ නිර්දේශ) (ව්‍යාපාර සහ පරිශ්‍ර) රෙගුලාසි (කැප්. 599F) (උදා.ශරීර යෝග්‍යතා මධ්‍යස්ථාන සහ රූපලාවණ්‍යාගාර වල සේවක මණ්ඩල)
12. ගෘහස්ත උදව්කරුවන්
13. දැනටමත් එන්නත් පළමු මාත්‍රාව ලබා සිටින කැටුව යන පුද්ගලයා(යින්)
14. වෙනත් අය (ඉහත දැක්වෙන කිසිම කණ්ඩායමකට අයත් නොවන අය)

<u>එන්නත් වාර්තා</u>

එන්නත ලබාගත් පසු එන්නත් වාර්තා පත්‍රයක් ඔබට ලැබෙනු ඇත. එසේම "iAM Smart" ජංගම යෙදුම හෝ “eHealth” ජංගම යෙදුම මගින් ඔබට විද්‍යුත් එන්නත් වාර්තා බාගත කළ හැකිය.

නවතම තොරතුරු සඳහා යොමු විය යුතු වෙබ් අඩවිය: https://www.covidvaccine.gov.hk/en/